## 358 පරලෝකේ මන්නාවෙනී

පරලෝකේ මන්නාවෙනී, ජීවිතදායකයෙනී
අනන්ත වූ ප්‍රේමයෙනී, වඩිනු මාගේ ජේසුනී

තොප වෙත ප්‍රේම වෙමී, මෙලොවට වැඩියෙමී
සියල්ලන්ගේ පාප බැමී, මුදාලන්ට කැමැත්තෙමී

ප්‍රේමණීය දරුවෙනී, වෙහෙස වූ සියල්ලෙනී
මා ළඟට රැස්වෙමිනී, නිදොස් වෙව් සතුටිනී

පාප දෝසෙන් මරණය, සිදු වන්නේ සත්තකය
ශ්‍රී පූපයෙන් ජීවිතය, ලබා ගන්නේ නිදොස් අය

ජේසු හට තුති වේවා, සමස්තයෝ ප්‍රේම වෙත්වා
ගැලවීමේ ජය දෙවා, සැම කල්හී ජීවත් වේවා